සැකසුම: බී. වයි. පී. රත්නසේකර, ජ්‍යේෂ්ඨ කථිකාචාර්ය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2014 අගෝස්තු
General Cetificate of Education (Adv.Level) Examination, August 2014

ගිණුම්කරණය I
Accounting I

**33 | S | I**

පැය දෙකයි
*Two hours*

**උපදෙස් :** විභාග අංකය :.......................................................

* අංක 1 සිට 30 තෙක් වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු තෝරා එහි අංකය ප්‍රශ්නයට ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.
* අංක 31 සිට 50 තෙක් වූ ප්‍රශ්නවලට කෙටි පිළිතුරු අදාළ තිත් ඉරි මත ලියන්න.
* සෑම ප්‍රශ්නයකට ම ලකුණු දෙක බැගින් හිමිවේ.
* විභාග අංකය, ඉහළින් ඇති කොටුවේ පැහැදිලිව සටහන් කරන්න.

| පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා | | | අත්සන |
|---|---|---|---|
| I පත්‍රය සඳහා | | 1 පරීක්ෂක | |
| ප්‍රශ්න අංකය | ලකුණු | 2 පරීක්ෂක | |
| 1 - 30 | | අති / ප්‍රධාන පරීක්ෂක | |
| 31 - 50 | | ගණිත පරීක්ෂක | |
| එකතුව | | ප්‍රධාන පරීක්ෂක | |

**(1). ගිණුම්කරණයේ ප්‍රධාන අරමුණ වන්නේ,**

1. ව්‍යාපාරයක් කෙරෙහි ඇල්මක් දක්වන සියලු පාර්ශවයන්ට තීරණගැනීමේදී ප්‍රයෝජනවත් වන මූල්‍යමය තොරතුරු සැපයීමයි..
2. ව්‍යාපාරයක කළමනාකරුවන්ට තීරණගැනීම සඳහා අවශ්‍ය අතීත වර්ථමාන හා අනාගත තොරතුරු සැපයීමයි.
3. ව්‍යාපාරය කෙරෙහි ඇල්මක් දක්වන විවිධ පාර්ශවයන්ටය තීරණ ගැනීමේදී ප්‍රයෝජනවත් වන තොරතුරු සැපයීමයි.
4. ඇල්මක් දක්වන සියලු පාර්ශවයන්ට තීරණ ගැනීමේදී ප්‍රයොජනවත් වන අතීත මූල්‍ය තොරතුරු සැපයීමයි.
5. ගිණුම්කරණ තොරතුරු ඉදිරිපත් කිරීම නීතියෙන් අනිවාර්ය කර ඇති නිසා එම නීතිමය අවශ්‍යතාවය ඉටු කිරීමයි.

(..............)

**(2). වෙළෙඳ ව්‍යාපාරයක සිදුවූ ගනුදෙනුවක් නිසා මූලික ගිණුම්කරණ සමීකරණයට වූ ශුද්ධ බලපෑම පහත පරිදිවේ.**

| | | | |
|---|---|---|---|
| **වත්කම්** | **=** | **හිමිකම +** | **වගකීම්.** |
| **70 000** | **=** | **20 000** | **50 000** |

**මෙම ගනුදෙනුව නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.**

1. **රු. 50 000 කට ණයට ගත් භාණ්ඩ රු. 20 000 කට විකිණීම**
2. **රු. 200 000 ක ධාරණ අගයන් ඇති වත්කමක් රු. 220 000 කට පවරා රු. 270 000 ක වත්කමක් ලබාගෙන ඉතිරිය පසුව ගෙවීමට එකඟවීම**
3. **රු. 70 000 ක වත්කම් මිලට ගෙන එයින් රු. 20 000 ක් ගෙවා ඉතිරිය පසුව ගෙවීමට එකඟවීම**
4. **රු. 50 000 ක් පිරිවැය වූ 70 000 කට විකුණා තිබූ භාණ්ඩ තොගයක් ආපසු එවීම**
5. **රු. 70 000 ක වත්කම් මිලට ගෙන එයින් රු. 20 000 ක් අයිතිකරුගේ මුදලින් ගෙවා ඉතිරිය සඳහා චෙක්පත් නිකුත් කිරීම**

(..............)

**(3). නිෂ්පාදන ව්‍යාපාරයක 2014 මාර්තු 31 න් අවසන් වසර සඳහා ලාභය රු. 180 000 කි. අයිතිකරු රු. 80 000 ක් ගැණිලි කර ඇති අතර රු. 20 000 ක අතිරේක ප්‍රාග්ධනයක් යොදා ඇත. වර්ෂය ආරම්භයේ තිබූ වගකීම්වලට වඩා වර්ෂය අවසානයේ තිබූ වගකීම් රු. 50 000 න් වැඩිය. වර්ෂය ආරම්භයේ මුලු වත්කම් රු. 500 000 කි. වර්ෂය අවසානයේ පැවති මුලු වත්කම්වල වටිනාකම කුමක්ද?**

| | | | | | |
|---|---|---|---|---|---|
| **1** | **රු. 170 000** | **2** | **රු. 620 000** | **3** | **රු. 290 000** |
| **4** | **රු. 670 000** | **5** | **රු. 680 000** | | |

(..............)

4. රු. 5000 ක් අඩමාන ණය සඳහා වෙන්කිරීම තුලින් ගිණුම්කරණ සමීකරණයට වන ද්විත්ව බලපෑම නිවැරදිව දැක්වෙන පිළිතුර තොරන්න.
   1. ලාභය රු. 5 000 න් අඩුවී වියදම් 5 000 න් අඩුවේ.
   2. වියදම් රු. 5 000 න් වැඩි වී හිමිකම රු. 5 000 න් අඩුවේ.
   3. වෙන්කිරීම් රු. 5 000 න් වැඩිවී හිමිකම රු. 5 000 න් අඩුවේ.
   4. වියදම් රු. 5 000 න් අඩුවී වත්කම් රු. 5 000 න් වැඩිවේ.
   5. වියදම් රු. 5 000 න් වැඩිවී වත්කම් රු. 5 000 න් අඩුවේ.

(.............)

Uva Province Sipsara Udana & studentlanka.com

**5. සියලු කරුණු නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.**

| | ගනුදෙනුව | මූලාශ්‍ර ලේඛණය | උපයෝගී පොත |
|---|---|---|---|
| 1. | ණයට විකුණුම් | මුදල් පොත | විකුණුම් ඉන්වොයිසිය |
| 2. | ආපසු එවුම් | හරපත | ආපසු එවුම් ජ'නලය |
| 3. | ස්ථාවර වත්කම් ක්‍ෂය | වව්චරය | පොදු ජ'නලය |
| 4. | අමුද්‍රව්‍ය ණයට ගැණුම් | ගැණුම් ඉන්වොයිසිය | ගැණුම් ජ'නලය |
| 5. | දුන් වට්ටම් | ජ'නල් වව්චරය | මුදල් පොත |

(..............)

**6. ව්‍යාපාරයක 2014 මාර්තු 31 න් අවසන් වසරේ ගණනය කල ලාභය රු. 220 000 කි. මෙම ලාභය ගණනය කර ඇත්තේ පහත සඳහන් වැරදි සිදුවී තිබියදීය.**

I. **රු. 20 000 ක විකුණුම් ඉන්වොයිසියක් සම්පූර්ණයෙන් මගහැරීම**

II. **10% ක අඩමාන ණය වෙන්කිරීමක් සිදුකල යුතු වුවත් එය 5% ක් ලෙස ගණන් බලා ගිණුම්ගත කිරීම එසේ 5% ක් ලෙස කරන ලද වෙන්කිරීම රු. 8 000 කි.**

**වැරදි නිවැරදි කල විට නිවැරදි ලාභය කොපමණද?**

1. රු. 240 000 2. රු. 218 000 3. රු. 23 000
4. රු. 232 000 5. රු. 230 000 (..............)

**7. 2013 ජුනි මාසය සඳහා බැංකුවෙන් එවන ලද බැංකු ප්‍රකාශයට අනුව ශේෂය රු. 48 000 ක් විය. පහත තොරතුරු සපයා තිබේ.**

I. **බැර නොවූ තැන්පතු රු. 4 000**

II. **බැංකුවට ඉදිරිපත් නොවූ චෙක්පත් රු. 9 000**

III. **රු. 7 000 ක් සෘජුවම බැංකුව වෙත එවූ බව ගනුදෙනුකරුවෙකු විසින් ලිඛිතව දක්වා තිබූ අතර ඒ අනුව මෙය ව්‍යාපාරය විසින් බංකු ගිණුමට හර කල නමුත් බැංකු ප්‍රකාශයේ ඇතුලත් වී නැත.**

**සංශෝධිත බැංකු ගිණුමේ ශේෂය කොපමණද?**

1. රු. 48 000 2. රු. 43 000 3. රු. 38 000
4. රු. 52 000 5. රු. 45 000 (..............)

**8. 2013.04.01 දිනට ණයගැති ශේෂ ලැයිස්තුවේ සහ පාලන ගිණුමේ ශේෂය රු. 73 000 ක් විය. 2013 /2014 වර්ෂය තුල ණයට විකුණුම් රු. 200 000 ක් වූ අතර ණයගැතියන්ගෙන් ලැබුනු මුදල් සහ දුන් වට්ටම් පිළිවෙලින් රු. 171 000 ක් සහ රු. 9 000 ක් විය. ලැබූ චෙක්පත් අගරු වීම් රු. 5 000 කි. 2014.03.31 දිනට ණයගැති ශේෂය කොපමණද?**

1. 98 000 2. රු. 105 000 3. රු. 91 000
4. රු. 88 000 5. ඉහත කිසියක් නොවේ. (..............)

9. පහත දැක්වෙන්නේ ව්‍යාපාරයක් විසින් අනුගමනය කල ගිණුම්කරණ පිළිවෙත් කීපයකි

A - තොගයේ පිරිවැයට වඩා ශුද්ධ උපලබ්ධ්‍ය අගය අඩු නිසා එය ශුද්ධ උපලබ්ධ්‍ය අගය දක්වා කපාහැර ඇත.

B - සේවකයෙක් විසින් වන්දියක් ඉල්ලා නඩුවක් පවරා ඇති බැවින් එම වන්දිය සඳහා වෙන්කිරීමක් සිදුකර ඇත.

ඉහත ගිණුම්කරණ පිළිවෙත් අනුකුල වන්නේ කුමන සංකල්ප වලටද යන්න නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.

| | A | B |
|---|---|---|
| 1. | විචක්‍ෂණ | ගැලපුම් |
| 2. | ගැලපුම් | ගැලපුම් |
| 3. | විචක්‍ෂණ | විචක්‍ෂණ |
| 4. | ගැලපුම් | ගැලපුම් |
| 5. | පිරිවැය | විචක්‍ෂණ |

(..............)

10. මූල්‍ය ගිණුම්කරණයේ සංකල්පීය රාමුව අනුව ආදායමක ලක්‍ෂණ ලෙස පහත ඒවා දී ඇත.

A - වත්කම් වැඩිවීමක් වගකීම් අඩුවීමක් වැනි ස්වරූප වලින් සිදු වේ.

B - ප්‍රතිලාභවල වැඩිවීමක් සිදුවේ.

C - හිමිකරුවන්ගේ දායක වීමකින් තොරව හිමිකම වැඩි වේ.
D - හිමිකරුවන්ගේ දායකවීමකින් හිමිකමේ සිදුවන වැඩි වීමකි.

ඉහත ඒවා අතරින් ආදායමක ලක්ෂණ ලෙස සැලකිය හැක්කේ මොනවාද?

1. A B සහ C 2. B සහ D 3. B සහ C
4. A සහ C 5. A, B, C සහ D (.............)

11 සහ 12 සඳහා පහත තොරතුරු භාවිතා කරන්න.

ව්‍යාපාරයක් විසින් මිලදී ගත් පිරිවැය රු 1 000 000 ක් වූ සුන්බුන් අගය රු. 200 000 ක් ලෙස ඇස්තමේන්තු කර තිබූ යන්ත්‍රයක සිව්වන වර්ෂය අගය දී එනම් 2013.03.31 දිනට සමුච්චිත ක්ෂය ප්‍රමාණය රු. 320 000 ක් විය. 2013.04.01 දින මෙහි සුන්බුන් අගය රු. 300 000 බවත් ඉදිරි ප්‍රයෝජනවත් ජීවකාලය වර්ෂ 5 ක් බවත් තීරණය කරන ලදී.

11. 2013.03.31 න් අවසන් වර්ෂය සඳහා ක්ෂයවීම් සහ එදිනට වත්කමේ ධාරණ අගය කොපමණද?

| | ක්ෂයවීම් | ධාරණ අගය |
|---|---|---|
| 1. | 76 000 | 604 000 |
| 2. | 40 000 | 680 000 |
| 3. | 80 000 | 680 000 |
| 4. | 100 000 | 580 000 |
| 5. | 80 000 | 480 000 |

(.............)

12. 2014.03.31 දිනෙන් අවසන් වසර සඳහා ක්ෂය ප්‍රමාණය කොපමණද?

1. රු. 80 000 2. රු. 76 000 3. රු. 140 000
4. රු. 200 000 5. රු. 136 000 (.............)

13. ව්‍යාපාරයක කාණ්ඩ කීපයකට අයත් අවසන් තොග පිළිබඳ විස්තරයක් පහත දැක්වේ.

| තොග කාණ්ඩය | ඉතිරි ප්‍රමාණ ඒකක | ඒකකයක පිරිවැය | ඒකකයක ශු . උ අගය |
|---|---|---|---|
| 1 | 200 | 40 | 35 |
| 2 | 500 | 20 | 21 |

කාණ්ඩ ක්‍රමයට තොගය ශුද්ධ උපලබ්ධ්‍ය අගය දක්වා කපා හරින්නේ නම්

| | ලාභාලාභ ගිණුමට කපාහරින අගය රු. | ශේෂ පත්‍රයේ දක්වන තොගය රු. |
|---|---|---|
| 1. | 500 | 17 500 |
| 2. | 500 | 18 000 |
| 3. | 1 000 | 17 000 |
| 4. | 1 000 | 18 000 |
| 5. | 500 | 17 000 |

(.............)

14. සංගමයක මසකට රු. 100 බැගින් ගෙවන සමාජිකයින් 200 ක් සහ යාවජීව සමාජිකයින් 50 ක් සිටී. යාවජීව සමාජික මුදල රු 4 000 කි. යාවජීව සමාජික මුදල් ලැබෙන වර්ෂයේදී ම ආදායමට ගැනීම සංගමයේ ප්‍රතිපත්තියයි. 2013/2014 වර්ෂය තුල හිඟ සාමාජික මුදල් කපාහැරීම් රු. 3 000 කි. එම වර්ෂය තුල අලුතින් සමාජිකයින් ඇතුලත් වී නැත.

2013 / 2014 වර්ෂය සඳහා ආදායම් හා වියදම් ගිණුමට බැරකල යුතු සාමාජික මුදල් ආදායම කොපමණද ?

1. රු. 20 000 2. රු. 240 000 3. රු. 25 000
4. රු. 300 000 5. රු. 237 000 (.............)

15. ව්‍යාපාරයක පහත තොරතුරු දී ඇත.

| | 2013.03.31 | 2014.03.31 |
|---|---|---|
| උපචිත වියදම් | 15 000 | 17 000 |
| ඉදිරියට ගෙවීම් | 8 000 | 3 000 |

මුදල් පදනමට 2012/2013 වර්ෂය සඳහා ගණනය කල ලාභය රු. 180 000 කි.

උපචිත පදනමට අනුව ලාභය කොපමණද?

1. රු. 177 000 2. රු. 187 000 3. රු. 173 000
4. රු. 183 000 5. රු. 166 000 (.............)

Uva Province Sipsara Udana & studentlanka.com

16. වර්ෂය තුල දැරූ ප්‍රාථමික පිරිවැය රු. 260 000 කි. වර්ෂය තුල දරන ලද නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය ප්‍රමාණය 140 000 කි. නොනිමි භාණ්ඩ වලට අදාල පිරිවැය පහත පරිදි ය.

| | 2013.04.01 දිනට | 2014.03.31 දිනට |
|---|---|---|
| සෘජු ද්‍රව්‍ය | 10 000 | 20 000 |
| සෘජු ශ්‍රමය | 8 000 | 10 000 |
| නිෂ්පාදන පොදුකාර්ය | 12 000 | 17 000 |

නිමි භාණ්ඩවල ප්‍රාථමික පිරිවැය කොපමණද?

1. රු. 272 000 2. රු. 383 000 3. රු. 388 000
4. රු. 248 000 5. රු. 417 000 (.............)

ප්‍රශ්න අංක 17 සහ 18 සඳහා අදාල තොරතුරු

රනිල් සහ බැසිල් විසින් පවත්වාගෙන ගිය හවුල් ව්‍යාපාරයේ පොත්වලින් පහත තොරතුරු උපුටාගෙන ඇත.

| | රනිල් | බැසිල් |
|---|---|---|
| 2013.04.01 දිනට ජංගම ගිණුම් ශේෂ (බැර) | 40 000 | 60 000 |
| 2014.03.31 දිනට ජංගම ගිණුම් ශේෂ (බැර) | 35 000 | 65 000 |
| වර්ෂය සඳහා ප්‍රාග්ධන පොලී | 30 000 | 20 000 |
| ගැණිලි | 50 000 | 40 000 |
| ප්‍රාග්ධන ගිණුම් ශේෂ | 450 000 | ? |

17. මෙම ව්‍යාපාරයේ 2013/ 2014 වර්ෂයේ ශුද්ධ ලාභය හෝ අලාභය සහ ලාභාලාභ අනුපාතය වන්නේ

| | ශුද්ධ ලාභය රු. | ලාභාලාභ අනුපාතය රනිල් : බැසිල් |
|---|---|---|
| 1. | 40 000 | 3 : 5 |
| 2. | 90 000 | 3 : 5 |
| 3. | 90 000 | 3 : 2 |
| 4. | 40 000 | 3 : 2 |
| 5. | 90 000 | 2 : 3 |

(.............)

18. මෙම ව්‍යාපාරයේ බැසිල්ගේ ප්‍රාග්ධන ගිණුමේ ශේෂය කොපමණද?

1. රු. 350 000 2. රු. 300 000 3. රු. 575 000
4. රු. 300 000 5. රු. 450 000 (.............)

19. නිවැරදි ප්‍රකාශය තෝරන්න.

1. වරණීය කොටස් නිකුවෙන් ලද මුදල හැමවිටම ප්‍රකාශකල ප්‍රාග්ධනයේ කොටසකි
2. වරණීය කොටස් නිකුතුවෙන් ලද මුදල හැමවිටම ජංගම වගකීමක් වේ.
3. වරණීය කොටස් ප්‍රාග්ධනය හැමවිටම ජංගම නොවන වගකිමක් වේ.
4. වරණීය කොටස් ප්‍රාග්ධනය හැමවිටම හිමිකමේ කොටසක් වේ.
5. වරණීය කොටසවල ස්වභාවය අනුව එය හිමිකම ලෙස හෝ වගකිම් ලෙස හදුනාගත යුතුය.

(.............)

20. සීමිත සමාගමක මූල්‍ය ප්‍රකාශවල අනිවාර්යෙන්ම හෙළිදරව් කල යුතු කරුණු ඇතුලත් කාණ්ඩය තෝරන්න.

1. බොල්ණය / ක්ෂයවීම් / පොලී / අධ්‍යක්ෂක සංවේතන / විගණන පාරිශ්‍රමික
2. ක්ෂයවීම් / පොලී / විගණන පාරිශ්‍රමික / අධ්‍යක්ෂක සංවේතන / දුන් වට්ටම්
3. අධ්‍යක්ෂක සංවේතන / විගණන ගාස්තු / ප්‍රසාද දීමනා / පාරිතෝෂික / වේතන
4. අර්ථසාධක / තොගය ශුද්ධ උපලබ්ධ්‍ය අගයට කපාහැරීම / ක්ෂයවීම් / අධ්‍යක්ෂක සංවේතන / විගණන පාරිශ්‍රමික
5. පොලී / කුලී / ලාභාංශ / පුරස්කාර / වට්ටම් (.............)

21. ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත අනුව ගිණුම් ඇස්තමේන්තු වෙනසකදී හා ගිණුම් ප්‍රතිපත්ති වෙනසකදී නිවැරදි ගිණුම්කරන පිළිවෙත් ඇතුලත් කාණ්ඩය තෝරන්න.

| | ගිණුම් ප්‍රතිපත්ති වෙනස්වීම | ගිණුම් ඇස්තමේන්තු වෙනස්කිරීම |
|---|---|---|
| 1. | අතීතයානුයෝගී නැවත ප්‍රකාශ කිරීම | අනාගයානුයෝගී නැවත ප්‍රකාශ කිරීම |
| 2. | අතීතයානුයෝගී භාවිතය | අතීතයානුයෝගී භාවිතය |
| 3. | අතීතයානුයෝගී භාවිතය | අනාගයානුයෝගී භාවිතය |
| 4. | ප්‍රවර්තන වර්ෂයට ගලපයි | අනාගත වර්ෂවලට ගලපයි |
| 5. | පෙර වර්ෂයෙන් ඉදිරියට ගෙන ආ ලාභ ශේෂයට ගලපයි. | ප්‍රවර්තන වර්ෂයට පමණක් ගලපයි |

22. ව්‍යාපාරයක් විසින් 2013.04.01 දින ගැණුම් මිල රු. 400 000 ක් වූ යන්ත්‍රයක් කල් බදු ක්‍රමයට ලබාගන්නා ලදී. මිලදී ගත දිනයේ ලමු වාරිකය ලෙස රු. 120 000 ක් ගෙවූ අතර ඉතිරිය රු. 120 000 බැගින් වන වාර්ෂික වාරික 4 කින් ගෙවිය යතුය. කල්බදු සඳහා වන මූල්‍ය ගාස්තු අංක එකතු කිරීමේ ක්‍රමයට කාලඡේද අතර බෙදාහැරේ.

2014 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභාලාභ ගිණුමට හර කල යුතු කල්බදු පොලී ප්‍රමණය කොපමණද?

1. රු. 60 000　　2. රු. 80 000　　3. රු. 50 000
4. රු. 43 332　　5. රු. 70 000　　(..............)

23. ආර්ථික ඇනවුම් ප්‍රමාණය ඇනවුම් කරන විට මුළු තොග පාලන පිරිවැය රු. 4 800 කි. වාර්ෂික තොග අවශ්‍යතාවය ඒකක 12 000 කි. ආර්ථික අනවුම් ප්‍රමාණය ඇනවුම් කරන්නේ යැයි සලකා නිවැරදි පිළිතුර තෝරන්න.

| | ආර්ථික ඇනවුම් ප්‍රමාණය | වාර්ෂික ඇනවුම් පිරිවැය | වාර්ෂික තොග පවත්වාගෙන යාමේ පිරිවැය |
|---|---|---|---|
| 1. | 1 200 | 4 800 | 4 800 |
| 2. | 1 200 | 2 400 | 2 400 |
| 3. | 600 | 2 400 | 2 400 |
| 4. | 600 | 4 800 | 4 800 |
| 5. | 300 | 2 400 | 2 400 |

(..............)

24. ව්‍යාපාරයක් විසින් ඒකක 8 000 ක ක්‍රියාකාරී මට්ටමේදී ඒකකයක පිරිවැය පහත පරිදි ගණනය කර ඇත.

| | ඒකකයක පිරිවැය |
|---|---|
| ප්‍රාථමික පිරිවැය | 50 .00 |
| පොදුකාර්යය පිරිවය | 40 .00 |
| | 90 .00 |

යන්ත්‍ර පැය මත පොදුකාර්ය පිරිවැය අවශෝෂණය කරන අතර අදාල ඒකක සංඛ්‍යාව සඳහා සත්‍ය යන්ත්‍ර පැය සංඛ්‍යාව 2 000 කි. අයවැයගත පොදුකාර්ය පිරිවැය රු. 300 000 පොදුකාර්ය පිරිවැය අන්තර්ග්‍රහණය අනුපාතය වන්නේ

1. රු. 150 යන්ත්‍ර පැයකට　　2. රු. 160 යන්ත්‍ර පැයකට
3. රු. 40 ඒකකයකට　　4. රු. 50 යන්ත්‍ර පැයකට
5. රු. 16 යන්ත්‍ර පැයකට　　(..............)

25. ව්‍යාපාරයක 2013 / 2014 වර්ෂයේ ලාභය රු. 200 000 කි. විකුණුම් රු. 100 000 කින් වැඩි කලහොත් ලාභය රු. 40 000 ක් වැඩි වේ යැයි අපේක්ෂා කෙරේ. රු. 200 000 ක ලාභයේ දී ආරක්ෂිත ආන්තික අනුපාතය 25% කි. සමච්ඡේද ලක්ෂය වන්නේ

1. රු. 500 000　　2. රු. 80 000　　3. රු. 1 500 000
4. රු. 750 000　　5. රු. 300 000　　(..............)

26. ආයෝජන ව්‍යාපෘතියක මූලික ආයෝජනය රු. 800 000 කි. මෙහෙයුම් මුදල් ප්‍රවාහයන් සහ පර්යන්ත මුදල් ප්‍රවාහයන් 15% ක ප්‍රාග්ධන පිරිවැය යටතේ වට්ටම් කල විට එම මුදල් ප්‍රවාහයනගේ වර්තමාන අගය රු. 800 000 කි. නිවැරදි පිළිතුර තෝරන්න.

| | ආයෝජනය මත ප්‍රතිලාභය | මුළු ශුද්ධ වර්තමාන අගය |
|---|---|---|
| 1. | 0 | 800 000 |
| 2. | 15% | 800 000 |
| 3. | 15% | 0 |
| 4. | 0 | 0 |
| 5. | 15% | 120 000 |

(..............)

27 සහ 28 සඳහා පහත තොරතුරු භාවිතා කරන්න.

ව්‍යාපාරයක බදු පසු ලාභය රු. 160 000 කි. බදු අනුපාතය 20% කි. වර්ෂයේ ලාභාලාභ ගිණුමට අයකළ ක්ෂයවීම් රු. 40 000 ක් වූ අතර පොලී රු. 12 000 කි. ස්ථාවර වත්කම් විකිණීමේ අලාභ රු. 20 000 කි. ගෙවූ ලාභාංශ රු. 60 000 කි. මුළු හිමිකම් රු. 500 000

| | 2012.03.31 | 2013.03.31 |
|---|---|---|
| තොගය | 30 000 | 35 000 |
| ණයගැතියෝ සහ ලැබිය යුතු අගයන් | 40 000 | 32 000 |
| ණයහිමියෝ සහ ගෙවිය යුතු අගයන් | 25 000 | 32 000 |

Uva Province Sipsara Udana & studentlanka.com

27. මෙහෙයුම් කටයුතු වලින් ජනිත වූ මුදල් ප්‍රමාණය කොපමණද?

1. රු. 282 000  2. රු. 292 000  3. රු. 262 000
4. රු. 242 000  5. රු. 252 000  (.............)

28. ස්කන්ධ ප්‍රාග්ධනය මත ප්‍රතිලාභය කොපමණද?

1. 32%  2. 20%  3. 40%
4. 25%  5. 15%  (.............)

29. ව්‍යාපාරයක 2013/2014 සඳහා මුලු විකුණුම් රු. 800 000 කි. දායක විකුණුම් අනුපාතය 40% කි. ආරක්ෂිත ආන්තික අනුපාතය 20% කි. ලාභය කොපමණද?

1. රු. 64 000  2. රු. 320 000  3. රු. 80 000
4. රු. 640 000  5. රු. 160 000  (.............)

30. ලාභ දායිත්වය ඇගයීම සඳහා භාවිතා කළ හැකි අනුපාතයක් නොවන්නේ කුමක්ද?

1. දළ ලාභ අනුපාතය  2. ශුද්ධ ලාභ අනුපාතය
3. ස්කන්ධ ප්‍රාග්ධනය මත ප්‍රතිලාභ අනුපාතය  4. මුලු වත්කම් ප්‍රතිලාභ අනුපාතය
5. තොග පිරිවැටුම් අනුපාතය  (.............)

❖ **31 සිට 50 තෙක් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ඉරි මත ලියන්න.**

31. (අ) වගකීමක ලක්ෂණ 02 ක් සඳහන් කරන්න.

(ආ) ආදායමක් යන්න නිර්වචනය කරන්න.

32. ව්‍යාපාරයක් සම්බන්ධයෙන් පහත තොරතුරු දී ඇත.

| | 2013.04.01 | 2014.03.31 |
|---|---|---|
| වත්කම් | 300 000 | ? |
| වගකීම් | - | 60 000 |

වර්ෂය ආරම්භයේ තිබූ වගකීම්වලට වඩා වර්ෂය අවසානයේ වගකීම් රු. 10 000 න් වැඩිය. 2012/ 2013 වර්ෂය තුළ උපයා ඇති ලාභය රු. 60 000 කි. ගැණිලි හෝ අමතර ප්‍රාග්ධනය නැත.

වර්ෂය අවසානයේ ප්‍රාග්ධනය රු. ______________________

වර්ෂය අවසානයේ වත්කම් රු. ______________________

33. පහත වගුව සම්පූර්ණ කරන්න.

| | ගනුදෙනුව | මූලික ලියවිල්ල | උපයෝගී පොත |
|---|---|---|---|
| 1. | සැපයුම්කරුවන් විසින් ගැණුම්මිලට එකතුකර තිබූ එකතු කළ අගය මත බදු | | |
| 2. | ණයගැතියන්ට දුන් මුදල් වට්ටම් | | |

34. I. වාර්තාකරණ දිනට පසු සිදුවීම් නිර්වචනය කරන්න.

II. වාර්තාකරණ දිනට පසු සිදුවීම් දෙවර්ගය නම් කරන්න.

35. අසම්භාව්‍ය වගකීම් ස්වරූප දෙකින් පවතී. ඒවා පැහැදිලි කරන්න.

36. ව්‍යාපාරයක් විසින් භාණ්ඩ ඒකක 2 000 ක් නිෂ්පාදනය කිරීමේදී ඒකකයක පිරිවැය රු 80 කි. ඒකකයක ප්‍රාථමික පිරිවැය රු 50 කි. යන්ත්‍ර පැය පදනම මත පොදුකාර්ය පිරිවැය අවශෝෂණය කෙරේ. සත්‍ය යන්ත්‍ර පැය සංඛ්‍යාව 500 කි. පොදු කාර්ය පිරිවැය අන්තර්ග්‍රහණ අනුපාතය කුමක්ද?

______________________________

37. පහත සඳහන් එක් එක් පදනම යටතේ පිරිවැය වර්ගීකරන ආකාරය දක්වන්න.

1. ස්වාභවය අනුව ______________________________
2. හැසිරීම අනුව ______________________________
3. පාලනය කිරීමේ හැකියාව අනුව ______________________________

38. ව්‍යාපාරයක මූලික වැටුප රු 120 000 කි. දීමනා රු 70 000 කි. 8% ක අර්ථසාධක සේවක දායකය වූ රු 9 600 සහ වැටුප් අත්තිකාරම් රු 2 000 ක් අඩුකරගෙන ඉතිරි වැටුප සේවකයින්ට ගෙවා ඇත. අර්ථසාධක අරමුදලට සේව්‍ය දායකය 12% කි.
මුලු ශ්‍රම පිරිවැය ගණනය කරන්න.

රු. ______________________________

39. සෑම වසරකම මාර්තු 31 දිනෙන් ගිණුම් වර්ෂය අවසන් වන ව්‍යාපාරයක 2013.04.01 දින පහත සඳහන් වැරැද්ද අනාවරණය විය. එම වරද නිවැරදි කිරීම සඳහා අවශ්‍ය ජ'නල් සටහන් දක්වන්න. (සංලක්‍ෂ්‍ය අවශ්‍ය නැත)

2011.04.01 දින රු 200 000 කට මිලදී ගත් කාර්යාල උපකරණ තොගයක් කාර්යාල උපකරණ අලුත් වැඩියා වියදම ගිණුමට හර කර එම වර්ෂයේ ලාභයට එරෙහිව ලියා හැර ඇත. කාර්යාල උපකරණ පිරිවැයෙන් 10% ක්‍ෂය කරයි.

______________________________

______________________________

______________________________

______________________________

40.පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් කරන ගිණුම්තැබීමකදී සෘජුවම අදාලවන සංකල්පය ලියා දක්වන්න.

අ. ස්ථාවර වත්කම් ක්‍ෂය කිරීම ______________________________

ආ. බොල් ණය කපාහැරීම. ______________________________

ඇ. විකිණීමේ හෝ ආපසු එවීමේ පදනම මත භාණ්ඩ යැවීම ______________________________

ඉ. තොග ඇගයීමට එකම ප්‍රතිපත්තිය දිගටම අනුගමනය කිරීම ______________________________

41. (අ) තොග යන්නට ඇතුලත් කලයුතු අංග මොනවාද?

______________________________

______________________________

(ආ) LKAS - 2 ප්‍රමිතියට අදාල තොග මැනීමේ රීතිය කුමක්ද?

______________________________

42. වත්මක පිරිවැය රු. 400 000 කි. සුන්බුන් අගය රු. 100 000 කි. ඵලදායී ජීවකාලය වර්ෂ 06 කි. මෙම වත්කම මිලදී ගෙන ඇත්තේ 2011.04.01 දිනදීය. 2013.10.01 දින මෙම වත්කම රු. 370 000 කට ප්‍රත්‍යාගණනය කරන ලදී.
අ. ප්‍රත්‍යාගණන ලාභය හෝ අලාභය වන්නේ රු.______________________________
ආ. 2013 මාර්තු 31 න් අවසන් වසර සඳහා ලාභලාභ ගිණුමට අයකල යුතු ක්‍ෂය ප්‍රමාණය ______________________________

43. හවුල් ව්‍යාපාරයක හවුල්කරුවන් විසින් හවුල්කරුවන්ගේ තත්වයෙන් කරන කටයුතු දෙකක් සඳහන්කර ඒ එක් එක් කාර්ය සඳහා හවුල්ව්‍යාපාරය විසින් හවුල්කරුට කරන ගෙවීම සඳහන් කරන්න.

______________________________

______________________________

Uva Province Sipsara Udana & studentlanka.com

44. අ. ව්‍යාපාරයක දල ලාභ අනුපාතය පෙර වර්ෂයට වඩා 5% න් වැඩි වී ඇතත් ශුද්ධ ලාභ අනුපාතය 2% න් අඩු වී ඇත. මීට බලපෑ හැකි හේතු දෙකක් සඳහන් කරන්න.

______________________________

______________________________

ආ. ව්‍යාපාරයක සමාන්‍ය තොගය රු. 80 000 කි. තොග පිරිවැටුම 6 වරකි. දල ලාභ අනුපාතය විකුණුම් වලින් 20% කි. කාලච්ඡේදයේ දල ලාභය ගණනය කරන්න.

දළලාභය රු. ______________________________

45. පහත සඳහන් සිදුවීම දී ඇති සාධක වලට කෙසේ බලපායිද?

| | ණය එකතු කිරීමේ කාලය | තොග නේවාසික කාලය |
|---|---|---|
| 1. ණයගැති පිරිවැටුම වැඩිවීම | | |
| 2. තොග පිරිවැටුම අඩුවීම | | |

46. අ. ඒකකයක පිරිවැය තීරණය කිරීමේ දී සත්‍ය පොදු කාර්ය පිරිවැයට වඩා අවශෝෂණය කල පොදුකාර්ය පිරිවැය යොදාගැනීම යෝග්‍ය බව සනාථ කරන කරුණු දෙකක් සඳහන් කරන්න.

______________________________

______________________________

ආ. අවශෝෂණය කල පොදුකාර්ය පිරිවැය රු 60 000
අයවැයගත පොදු කාර්ය පිරිවැය රු. 80 000
සත්‍ය පොදු කාර්ය පිරිවැය රු. 40 000 ______________

ඒකකයක පිරිවැය අව තක්සේරු වේද අධි තක්සේරු වේද? ______________

පොදු කාර්ය පිරිවැය ඌන හෝ අධි අවශෝෂණය කොපමණද?

47.

| | |
|---|---|
| ප්‍රාථමික පිරිවැය | රු. 100 000 |
| සත්‍ය පොදු කාර්ය පිරිවැය | රු. 50 000 |
| පොදු කාර්ය පිරිවැය ඌන අවශෝෂණය | රු. 4 000 |
| නිපදවූ ඒකක සංඛ්‍යාව | 200 |

අවශෝෂණය කල පොදු කාර්ය ප්‍රමාණය රු. ______________________________

ඒකකයක පිරිවැය ______________________________

48. ව්‍යාපාරයක ක්‍රියාකාරී මට්ටම සහ ඒ ඒ මට්ටමේ දී ලාභය හෝ අලාභය පහත දැක්වේ.

| ක්‍රියාකාරී මට්ටම | ලාභය /(අලාභය) |
|---|---|
| 2 000 | (10 000) |
| 3 000 | 10 000 |

සමච්ඡේද ලක්ෂය ඒකක ______________________________

ඒකක 5 000 ක් විකිණීමේ දී ලාභය රු. ______________________________

49. අ. සමච්ඡේද ලක්ෂ විග්‍රහයේ උපකල්පන 2 ක් සඳහන් කරන්න.

______________________________

______________________________

ආ. මුලු විකුණුම් රු. 400 000 ක් වන අතර ආරක්ෂිත ආන්තික අනුපාතය සහ දායක විකුණුම් අනුපාතය පිළිවෙලින් 25% ක් සහ 40% ක් වේ. ශුද්ධ ලාභ අනුපාතය කුමක්ද?

______________________________

50. ව්‍යාපාරයක සමාන්‍ය තොගය රු. 80 000 කි. තොග පිරිවැටුම 6 වරකි. දල ලාභ අනුපාතය විකුණුම් වලින් 25% කි. අතිරේක ආදායම් නොමැති අතර මෙහෙයුම් වියදම් දල ලාභයෙන් 40% කි.

I. ශුද්ධ ලාභ අනුපාතය කුමක්ද? ______________________________

II. තොග නේවාසික කාලය කොපමණද? ______________________________